# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2193/30 - 2020 සැප්තැම්බර් මස 16 වැනි බදාදා - 2020.09.16

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### රාජ්‍ය සේවා කොමිෂන් සභාව

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 57(1) වන ව්‍යවස්ථාව ප්‍රකාරව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලතල පැවරීම

1. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 57(1) වන ව්‍යවස්ථාවේ 1 වන ඡේදයේ නියමයන්ට අනුකූලව පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලතල පවරන ලද, අංක 1955/22 හා 2016.02.25 දිනැති *අති විශෙෂ ගැසට්* නිවේදනය මගින් සංශෝධිත අංක 1941/41 හා 2015.11.20 දිනැති *අති විශෙෂ ගැසට්* නිවේදනයේ පළ කරනු ලැබ ඇති උපලේඛණයේ I කොටසේ, අංක 17 සහ 18 යටතේ පවතින විධිවිධාන 2020.09.17 වැනි දින සිට බලපවත්වන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ.

2.

| *I තීරුව*<br>*නිලධාරී ගණය* | *II තීරුව*<br>*බලතල පවරනු ලබන රාජ්‍ය නිලධරයන්* | *III තීරුව*<br>*පවරන ලද බලතල* |
|---|---|---|
| 17. ජාතික විගණන කාර්යාලයේ,<br>(අ) ශ්‍රී ලංකා විගණන සේවයේ නිලධරයන්<br><br>(ආ) විගණන පරීක්ෂක සේවයට අයත් අංක 06/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ (II ඇමුණුම) හි අර්ථ නිරූපණය කර ඇති තෘතීයික මට්ටමේ අධි ශ්‍රේණියේ/විශේෂ ශ්‍රේණියේ නිලධරයන් | ජාතික විගණන කාර්යාලයේ අධ්‍යක්ෂ (පාලන) | (I) රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබූ පටිපාටිවලට අනුකූල ස්ථාන මාරු කිරීම.<br><br>(II) ආයතන සංග්‍රහයේ XLVIII පරිච්ඡේදයේ දෙවන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති වැරදි සම්බන්ධයෙන් වූ විනය පාලනය |

1A - G 032906 - 23 - (2020/09)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

| *I තීරුව*<br>*නිලධාරී ගණය* | *II තීරුව*<br>*බලතල පවරනු ලබන රාජ්‍ය නිලධරයන්* | *III තීරුව*<br>*පවරන ලද බලතල* |
|---|---|---|
| 18. ජාතික විගණන කාර්යාලයේ,<br>(අ) අධි ශ්‍රේණියේ/විශේෂ ශ්‍රේණියේ නිලධරයන් නොවන, අංක 06/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ (II ඇමුණුම) හි අර්ථ නිරූපණය කර ඇති තෘතීයික මට්ටමට අයත් විගණන පරීක්ෂක සේවයේ නිලධරයන්<br>(ආ) ඒකාබද්ධ සේවාවලට අයත් නොවන අංක 06/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ අර්ථ නිරූපණය කර ඇති ප්‍රාථමික හා ද්විතීයික මට්ටමේ නිලධරයන් | ජාතික විගණන කාර්යාලයේ අධ්‍යක්ෂ (පාලන) | (I) රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබූ බඳවා ගැනීමේ පටිපාටි/සේවා ව්‍යවස්ථා අනුව පත්කිරීම සහ උසස් කිරීම.<br>(II) රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබූ පටිපාටිවලට අනුකූල ස්ථාන මාරු කිරීම.<br>(III) විනය පාලනය හා සේවයෙන් පහ කිරීම. |

3. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලතල පවරන ලද අංක 1941/41 හා 2015.11.20 දිනැති අති *විශෙෂ ගැසට්* නිවේදනයෙහි අනෙකුත් කරුණු නොවෙනස්ව පවතී.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අණ පරිදි,

**එම්. ඒ. බී. දයා සෙනරත්,**
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2020 සැප්තැම්බර් මස 16 වැනි දින,
අංක 1200/9, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ දී ය.

10 - 64

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.